## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ජපන් භාෂාව විෂය ඉගැන්වීමේ ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ගුරු මාර්ගෝපදේශය භාවිත කිරීමට පෙර, දී ඇති උපදෙස් කියවා එය භාවිත කරන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත යුතු වේ.

නිපුණතා පාදක විෂයමාලාවක් යටතේ ඉදිරිපත් කර ඇති මෙම ගුරුමාර්ගෝපදේශය, විෂය නිර්දේශයේ නිපුණතා හා නිපුණතා මට්ටම් සියල්ල ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් සකස් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශය මැනවින් පරීක්ෂා කර අදාළ නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, ඉගෙනුම් පල හා කාලච්ඡේද සංඛ්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නැවත පාඩම් සකස් කර ගැනීමට ඔබට අවකාශ ඇත. එහි දී ඔබට උචිත පරිදි කාලච්ඡේද යොදා ගත හැකි ය. ගුරු මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරකම් භාවිත කිරීමේ දී ඔබේ ශිෂ්‍යයන්ට වඩාත් ගැළපෙන පරිදි ඉගෙනුම් ක්‍රමවේද යොදා ගැනීමේ නිදහස ඔබට ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් ද්‍රව්‍ය වශයෙන් විමර්ශන ග්‍රන්ථ නාමාවලියක් ක්‍රියාකාරකම අවසානයේ ඉදිරිපත් කර ඇති අතර තම ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන ආකාරයේ විෂය පිළිබඳ ප්‍රාමාණිකයන් විසින් සම්පාදනය කරන ලද ග්‍රන්ථ යොදා ගැනීමට ඔබට අවකාශ තිබේ. මෙහි යෝජනා කර ඇති පාඩම් සැලසුම් සඳහා ඉදිරිපත් කර ඇති උපදෙස් අනුගමනය කරමින් ගුණාත්මක ඉගෙනුම් ක්‍රියාකාරකමක යෙදීමට ඔබ පියවර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඇගයීමේ හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා නිර්ණායක ඉදිරිපත් කර ඇත. ඔබ එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩ පිළිවෙළක් සකසා ගත යුතු ය. ශිෂ්‍යයන්ගේ නිර්මාණ කුසලතා හඳුනා ගෙන ඒවා වර්ධනයට අවස්ථා සලස්වමින් පන්ති කාමරයේ ශිෂ්‍යයාට ඉගෙනීම සඳහා ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇතැයි සිතමි.

**එච්. කේ. ගීතිකා සෙනෙවිරත්න**
ව්‍යාපෘති නායක

